චක්‍රලේඛ අංක: 13/2003

මගේ අංකය:- ප්‍ර.කො.01/19
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280,
කෙලින් වීදිය,
කොළඹ 11.
2003.10.17

සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## ඔප්පු කෙටුම්පත් විනාශ කිරීම

" ලියවිලි විනාශ කිරීම !" මැයෙන් ම විසින් නිකුත් කර ඇති අංක 2/87 හා 87.02.11 දින දරණ චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. දීර්ඝ කාලයක් ඔප්පු කෙටුම්පත් විනාශ නොකර කාර්යාල වල තැන්පත් කර තැබීම නිසා, ඒවා වෙයන් හා විනාශ වන බවත්, මේ නිසා අනිකුත් ලේඛණ ආරක්‍ෂා කිරීමට පවා දුෂ්කරතා ඇති වී ඇති බවත්, කාර්යාලවල ඉඩකඩ ඇහිරී ඇති බවත්, මා වෙත වාර්තා වී ඇත.

03. මේ නිසා ඔප්පු කෙටුම්පත් විනාශ කිරීම සම්බන්ධව නොතාරිස් ආඥා පනතේ (107 අධිකාරය) 42 වගන්තියේ අතුරු විධානයෙන් හා ඔප්පු ලියාපදිංචි කිරීම පිළිබඳ දෙපාර්තමේන්තු අත්පොතේ 602 සිට 607 දක්වා වූ වගන්තිවල සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. ඔබගේ පහසුව සඳහා නොතාරිස් ආඥා පනතේ 42 වගන්තියේ අතුරු විධානය පහත සඳහන් කරමි.

> " එසේ වුවද, ඉහත අන්තිමට දැක්වුණ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත භාරදෙනු ලැබූ අන්තිම කැමති පත්‍රයක හෝ උණ පූර්ණ පත්‍රයක කෙටුම්පතක් හෝ පිටපතක් නොවන යම් ලේඛණයක්, ඒ ලේඛණයේ අනු පිටපත තම කාර්යාලයෙහි ලේඛන මිටි සමග සුරක්‍ෂිතව තිබෙන බවට යථා පරිදි කරනු ලැබූ පරීක්‍ෂණයකින් පසු තමා සෑහීමට පත් වුවහොත් තමාට ඒ ලේඛණය භාරදෙනු ලැබූ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් ගත වීමෙන් පසු කවර වේලාවක වුවත් රෙජිස්ට්‍රාර් විසින් විනාශ කරනු ලැබිය හැකිය. "

05. දෙපාර්තමේන්තු අත්පොතේ 602-607 දක්වා වූ වගන්ති වල උධෘතයක්ද මේ සමග ඔබ වෙත එවමි. මෙම උපදෙස් අනුව කටයුතු කර මසක් ඇතුලත මාවෙත වාර්තා කරන ලෙසද දන්වමි.

06. මේ සම්බන්ධයෙන් ඔබට යම් පහසුකමක් අවශ්‍ය වේ නම් ඒ පිළිබඳවද මා වෙත නොපමාව වාර්තා කරන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත :-1. ප්‍රධාන කාර්යාලයේ හා මධ්‍යම ලේඛණාගාරයේ
සියලුම මාණ්ඩලික නිළධාරීන් - දැ.ගැ.පි.
2. සියලුම කලාපයන්හි ස.රෙජි.ජ.වරුන් වෙත- දැ.ගැ.සහ අ.ක.ස
3. අභ්‍යන්තර විගණන අංශය - විගණන පරීක්‍ෂණ වලට යනවිට මෙම
කාර්යය පිළිබඳව සැලකිලිමත් වන

**කෙටුම්පත් විනාශ කිරීම.**

602 කෙටුම්පත් විනාශ කිරීමේ ප්‍රශ්නය සෑම අවුරුද්දකටපසු සලකා බැලිය යුතුයි.

**විනාශ නොකළ හැකි කෙටුම් පත්.**

603 (1) නොතාරිස් වෘත්තියේ කටයුතු අත්හිටවූ නමුත්, තවමත් ජීවතුන් අතර සිටින නොතාරිස්වරුන්ගේ කෙටුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අවසරය නැතිව විනාශ නොකළ යුතුයි.

(2). දෙවෙනි පිටපත යහපත් තත්ත්වයෙන් එනම් :-
(අ). සම්පූර්ණවද,
(ආ). කියවිය හැකිව හා කියවිය නොහැකි තත්ත්වයකට නොවැටෙන සුළුවද,
පවත්නේ නම් මිස නැත්නම්, කෙටුම්පත් විනාශ කළයුතු නොවේ.

**කෙටුම්පත් විනාශ කිරීමට පෙර දෙවෙනි පිටපත් පරීක්ෂා කර බැලිය යුතු බව.**

604 (1) විනාශ කිරීම අනුමත කිරීමට පෙර, සෑම දෙවෙනි පිටපතක්ම හොඳින් පරීක්ෂා කර බැලිය යුතුයි. මෙසේ පරීක්ෂා කර බැලීමේ දී නීත්‍යානුකූල ලේඛනය සම්පූර්ණයෙන්ම කියවා බැලීම අනවශ්‍ය නමුත්, යටත් සීමාවත් ඇතුළත ඒ පරීක්ෂණය පරිස්සමින්ත් නිවැරදි ලෙසත් කළ යු

(2). පරීක්ෂා කිරීමේද කාර්යය කළ යුත්තේ ස්ථිර ලිපිකාර සේවයෙහි නියුක්ත පළපුරුදු නිලධාරීන් විසිනි.

**කෙටුම්පත් විනාශ කිරීමෙන් පසු ලියන සහතිකය.**

605 කෙටුම්පත් වලින් යම්කිසි කොටසක් විනාශ කර දැමුවාට පසු ඒ විනාශ කළ කෙටුම්පත්වලට අදාළ සියලුම ඔප්පුවල දෙවෙනි පිටපත් පරීක්ෂා කර බැලූ බවටත්, ඒවා මනා තත්වයෙන් තිබූ බවටත්, ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් මෙහි පහත සඳහන් ආකෘතියේ ප්‍රකාරයට සහතියක් ලිවිය යුතුයි. ලැබුණු පිටපත් පිළිබඳ ලැයිස්තු වේ (563 (1) දෙ.න්) නියමිත ස්ථානයෙහි මේ සහතිකය ලියා, එහි දෙවෙනි පිටපතක් ප්‍රධාන කාර්යාලයට යැවිය යුතුයි.

## සහතිකයේ ආකෘතිය

කෙටුම්පත් විනාශ කර දමන ලද්දා වූද, ..... පදිංචි ........ නොතාරිස් විසින් සාක්ෂ්‍ය දරන ලද්දාවූද අංක ......... සිට අංක ........ දක්වා වූ ඔප්පුවල දෙවෙනි පිටපත් සම්පූර්ණ බවත්, කියවිය හැකිබවත්, කියවිය නොහැකි තරම් තත්ත්වයකට පත් නොවන සුළු බවත්, මනා තත්ත්වයෙන් පවතිනා බවත් ..... ඉඩම් රෙජිස්ට්‍රාර් තැන්පත් ........ වන මම මෙහින් සහතික කරමි.

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය ..............19.......

ඉඩම් රෙජිස්ට්‍රාර්

විනාශ කළයුතු කෙටුම්පත් කැලි වලට ඉරාදැමිය යුතු බව

606 කෙටුම්පත් වලින් යම්කිසි කොගයක් විනාශ කිරීම පිණිස අවසාන වශයෙන් අනුමත කරනු ලබන විට, විනාශ කිරීමට පෙර ඒ ලේඛන කැලි වලට ඉරා දැමිය යුතුය.

පරිස්සම් කළ කෙටුම්පත්

607 විනාශ නොකරන ලද කෙටුම්පත් සම්බන්ධයෙන් වූ විට, 563 දෙ.නි.නියම කරන ඇති පරිදි ක්‍රියා කළයුතුයි.

ලැබුණු කෙටුම්පත් හා අඩු කෙටුම්පත් පිළිබඳව දෙ.නි.38 හා 39 බලන්න.

ජ්‍යෙ/